Page 13 April 2013.qxd 28/05/2013 14:55 Page 1



# අප හැරගිය කිවියර සේසිරි විජේසේකර



කිවිපති
සේසිරි විජේසේකර මහතා

කොළඹ යුගයේ දීප්තිමත් කවියෙකු ලෙස බැබළුනු එසේම අගනුවර තරුණ කවි සමාජයේ හිටපු ලේකම්වරයෙකු මෙන්ම එහි සබාපති පදිවියද හෙබවූ සේසිරි විජේසේකර කවියාණෝ ගිය සතියේ එනම් අප්‍රියෙල් මස 7 වන දින කොළඹදී අභාවප්‍රාප්ත වූහ.

1933 පෙබරවාරි මස 15 වෙනිදා දක්ෂිණ ලංකාවේ අහුංගල්ලේ උපත ලද සේසිරි විජේසේකර මහතා අගනුවර කොළඹට එන්නේ රජයේ රැකියාවක් සඳහා ය. 1953 ජනවාරි මස 02 වන දා සේසිරි විජේසේකර කවියා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ රජයේ බෙහෙත් ගබඩාවේ වැඩ භාරගත්තේය. කොළඹ බෝඩිං කාමර වලට හුරුවූ ඔහුට එකල කොළඹ පදිංචිව සිටි ජ්‍යෙෂ්ඨ කවියන් ඇසුර ලැබීමේ වාසනාව ලැබිණ. ඒ විමල් අභයසුන්දර සහ විමලේන්ද්‍ර වතුරේගම ය. ගමෙන් කොළඹ පැමිණ රැකියාවක නිරතව සිටි චිත්‍රානන්ද අබේසේකර නම් කළණ මිතුරා ද ඔහුට හමුවුණේ ය.

කොළඹ දී කලා ජීවිතයට හුරුවූ සේසිරි විජේසේකරයන්ට ගුවන්විදුලියේ සිටි උසස් නිලධාරියෙකු වූ තේමිස් ගුරුගේ, ඩී. එම්. කොළඹගේ වැනි ප්‍රවීනයන් සමග වැඩ සටහන් කිරීමේ අවස්ථාව උදාවිය.

මා කුඩා අවධියේ සේසිරි මාමා අප ජීවත් වූ මරදානේ පොලිස් නිවාසයට සිය රාජකාරි අවසන්ව බතික් කමීසයක් හැඳ ලෙදර් බෑගයක් ද අතින් ගෙන පැමිණි සැටි මට මතකය.

1963 වසරේ එවකට 13 වන වියේ සිටි මට ගුවන් විදුලියෙන් සුපුරුදු කටහඬක් ඇසිණ. ඒ දහවල් ප්‍රවෘත්ති වෙලාවයි. ප්‍රවෘත්ති අවසන සේසිරි විජේසේකර යන නම කියැවුණේය. පුවත් පත් සඟරාවල මෙන්ම ගුවන් විදුලියෙන් ද නිතර සේසිරි මාමාගේ නම දකින්නට අසන්නට ලැබිණ. එහි ගෞරවය හිමි විය යුත්තේ විමල් අභයසුන්දර නමු වූ ජ්‍යෙෂ්ඨ කිවිඳුන්ට යයි සිතමි.

අප කුඩා කල හැදුනේ වැඩුණේ මරදානේ පොලිස් නිවාසයේය. තාත්තාගේ ඡායාරූප පන්ති, අභිධර්ම පන්ති හා අතකස කාරක සභා රැස්වීම් ද තිබුණේ ද එම කුඩා නිවසේය.

තාත්තා ගෙදර නැති අවස්ථාවල ඔහුගේ පොත් අල්මාරිය අවුස්සා කවිපොත් කියවීම මගේ සිරිතයි. ඒ පොත් අතර මීවදය, සුවඳ, දේදුන්න, සිසිල, සිංහළ කවිකිරුළ හා මී අඹ වනය යන කවි සඟරා වීය. ඒ අතර මට හමුවූයේ අතකස කවිකිවිඳියන්ගේ නාම ලේඛනයයි. එහි අංක 121 ට සඳහන්ව තිබුණේ අංක 39 ගෙත්තම් පාර, බොරැල්ල ලිපිනයේ පදිංචි සේසිරි විජේසේකර මාමාගේ නමය.

1954 දී බ්‍රිතාන්‍ය මහ රැජින ලංකාවට පැමිණි පළමු අවස්ථාවේ සිට රටතොට සිදුවීම් මට මතකය. අ.ත.ක.ස. කාරක සභා නැති අවස්ථාවේ පවා අපේ ගෙදරට කවියෝ ලේඛකයෝ ආහ. ඒ තාත්තා කළ කවි ලේඛක ඡායාරූප ප්‍රදර්ශනයට පින්තූර ගන්නා කාලයයි.

අතකස වැඩ කරගැනීමට තාත්තා සේසිරි කවියාණන්ව උප ලේකම් වරයෙකු ලෙස පත්කරගත්තේ කොරතොට අයි. සී. පෙරේරා කවියා ද සමගය. ඒ තාත්තා අතකස ප්‍රධාන ලේකම් වශයෙන් වැඩකළ කාලයයි.

ඉන් ටික කලකට පසු එනම් 1970 දී තාත්තා සමග සම ලේකම් ධූරයට සේසිරි මාමා පත්වීය. ලංකා කලා සංගමයේ කටයුතු වලටද තාත්තා ඔහු සහභාගි කරගත්තේය.

අතකස සම ලේකම් ධූරයට පත්වූ මුල් අවුරුද්දේ එහි 35 වන ජයන්තිය පැවැත්වීමට යැවූ ආරාධනාවද වූයේ කවියකිනි. ඒ මෙයයි.

**අතකස යට තිස්පස්**
**වස් පිරිමේ ජයන්ති**
**කවි මුලුව යෙදේ හැත්තෑ**
**එකේ දෙසැම්බරේ**
**දහ නම වෙනිදා එන්නැයි**
**කියා සිත් දයාවෙන්**
**ඔබ සැමට මෙයින්**
**ආරාධනාවයි කෙරෙන්නේ**

**මේ වගට,**
**විල්සන් හෑගොඩ සමග**
**සේසිරි විජේසේකර**
**සම ලේකම්වරු**

විල්සන් හෑගොඩ කිවිඳුන්ගෙන් පසු අතකස ලේකම් ධූරයට පත් සේසිරි කවියාණෝ 1993 අගෝස්තු මාසයේ එහි සභාපති පදවියට පත්වූහ. බොහෝ කලක් එහි නිරතව සිටි ඔහු චිත්‍රානන්ද අබේසේකරයන් සභාපති ව සිටි කල්හි චීන රජයෙන් ලද ආරාධනාවක් පරිදි අතකස සාමාජිකයින් චීනයේ සංචාරයකට රැගෙන යාම ද සංවිධානය කළේය.

තම අගනා ජීවිතයෙන් වැඩි කාලයක් ශ්‍රීලංකාවේ කාව්‍ය, ජනමාධ්‍ය සහ සාහිත්‍යමය ප්‍රමිතීන් ඔසවා තැබීම සඳහා සේසිරි කවියා විසින් කරන ලද ඉමහත් සේවාව මෙවැනි කෙටි ලිපියකින් ලියා අවසන් කළ නොහැක.

ඔහුගෙන් පසුව එම සේවාව පවත්වාගෙන යාමට පුතණුවෝ දෙදෙනෙක් සිටිති. එයින් ආසිරි නම් වූ කණිෂ්ඨ පුත්‍රයා අද අතකස ප්‍රධාන සංවිධායකවරයාය. සිය පියාගේ මෙහෙය පුතා දිගටම ගෙනයනු ඇත.

අසූ වියේහිදී අප ද, සිංහල කවි කෙත ද හැරගිය සේසිරි විජේසේකර මැතිඳුනි, ඔබට නිවන් සුව අත්වේවා !

ආසිරි අසලින් සේසිරි හිටියත්
සේසිරි අසලින් ආසිරි හිටියත්
දුකින් පිරී ඇත මා හද කුටියත්
පුදනෙමි අදරින් හදපිරි බැතියත් !

♦ ***ආර්. පාලිත හෑගොඩ***

***අගනුවර තරුණ කවි සමාජයේ***
***සම ලේකම්***
***කොළඹ දී ය.***

# ශ්‍රීලංකා නීතිඥ සංගමයේ නව සභාපති



***උපුල් ජයසූරිය මහතා***

උපුල් ජයසූරිය පිළිබඳව ශ්‍රීලාංකික ජනසමාජයට අලුතින් හඳුන්වාදීමක් අවශ්‍ය නැත. නීති ක්ෂෙත්‍රයේ ඉහළින් බැබළෙන, එසේම මූලික අයිතිවාසිකම්, මානුෂික අයිතිවාසිකම් වෙනුවෙන් අද ශ්‍රී ලංකා ශ්‍රෙෂ්ඨාධිකරණයේ පෙනී සිටින අංක එකේ අධිනීතිඥවරයා ඔහු ය.

වසර තිස් හතක් පුරා ඔහු ශ්‍රී ලංකා නීති ක්ෂෙත්‍රයට මෙන්ම රාජ්‍ය සංස්ථා පාලනය මගින් කර ඇති සේවය ඉමහත්ය. මිනිස් අයිතිවාසිකම් පිළිබඳ නඩුවලදී ඔහු දක්වන දක්ෂතාව, අදීනත්වය මෙන්ම නිර්භීත බවද ශ්‍රීලංකාවේ පමණක් නොව ලෝකයේ බොහෝ රටවල නීති ක්ෂෙත්‍රයන්හි ප්‍රසාදයට ලක්ව තිබේ.

පසුගියදා පැවති ශ්‍රීලංකා නීතිඥ සංගමයේ නිලවරණයෙන් වැඩි ඡන්ද දෙදහකටත් වඩා ලබා ගනිමින් වාර්තාවක් පිහිටවූ ඔහු විසින් 1992 දී එහි ප්‍රධාන ලේකම් ධූරයද, 2008 දී කොළඹ නීති සංගමයේ සභාපති ධූරයද හොබවන ලදී.


උපුල් නීති ක්ෂෙත්‍රයට ඇතුල් වනවිට එහි සිටි ලාබාලයා ඔහු විය. නීතිපති දෙපාර්තමේන්තුවට සම්බන්ධව එහි පුහුණුව ලැබූ සමයේ ඔහුගේ සමකාලීනයන් වූයේ අද ශ්‍රෙෂ්ඨාධිකරණයේ සිටින විනිසුරුවරුන් සතර දෙනෙකි. නීතිපති දෙපාර්තමේන්තුවේ සිටියදීම මහ කොළඹ ආර්ථික කොමිසමේ නීති නිලධාරි ලෙස පත්කරනු ලැබූ ජයසූරිය මහතා ට්‍රැක්ටර් සහ මේද සහ තෙල් සංස්ථාවන්හි සභාපති ධූරය දැරුවේ ය. ට්‍රැක්ටර් සංස්ථාවේ හොඳම යුගය උපුල් ජයසූරිය යුගය බව අදත් බොහෝ දෙනා පිළිගන්නා කරුණකි.

ජෙනරාල් සරත් ෆොන්සේකා වෙනුවෙන් ජනාධිපති නිලවරණ පෙත්සම ද, හිටපු අගවිනිසුරු සරත් සිල්වා මහතාට විරුද්ධව ගෙන ආදෝෂාභියෝගය පිළිබඳ ජාත්‍යන්තර නීතිඥ සංගමය නියෝජනයකිරීම ද, බැංකු ආදී රැකියාවන්හි නියුතු නීතිඥවරුනට ඔවුන් කරන අමතර කාර්‍යයන් වෙනුවෙන් දීමනාවක් ඔවුන්ට ලබාගැන්මට මං සැලසීම ද ජයසූරිය මහතාගේ නීති ජීවිතයෙන් බිඳකි.

මෙවර ශ්‍රීලංකා නීතිඥ සංගමයේ නිලවරණයට ඔහුගේ නම යෝජනා කරන ලද සුපතල නීතිඥවරුන් හයදෙනා අතර ජනාධිපති නීතිඥවරුන් වන රෝමේෂ් ද සිල්වා, ඉක්රාම් මොහොමද් සහ ආනන්ද විජේසේකර මහත්වරු සිටිති. ජාත්‍යන්තර තලයට පිවිසි ශ්‍රීලංකා නීතිඥවරුන් අතරට එක්ව සිටින උපුල් ජයසූරිය මහතාගේ බිරිඳ චූලා සහ දරුවන් දෙදෙනා ද නීතිඥවරු වන්නාහ.




# 'පුනරාලෝකය' දොරට වැඩිය දා




ප්‍රංශයේ **La Corneauve** ප්‍රදේශයේ පැරිස් ධම්මචක්ක දහම් පාසැලේ ආචාරිණීයක වන අංජලී දිල්රුක්ෂී රත්නායක ලේඛිකාව විසින් තම රාජකාරි කර්තව්‍යයන්හි විරාමයන් අතර ලද විවේකයෙන් පල ලබමින් නිර්මාණය කරන ලද "පුනරාලෝකය" නම් වන ඇගේ පළමු සොඳුරු නවකතා නිමැවුම පැරිස් ධම්මචක්ක විහාරාධිපති ගෞරවාර්හ පූජ්‍ය කෝන්ගස් දෙනියේ ආනන්ද ස්වාමීන් වහන්සේට පිළිගැන්වූ අවස්ථාවයි මේ.

මෙම උත්සවයට දහම් පාසැලේ දරුවන් ගුරුදෙගුරුන්සේම ප්‍රංශයේ ශ්‍රීලංකා තානාපති කාර්‍යාලයේ සංස්කෘතික කටයුතු භාර දෙවන ලේකම් කිසාගෝතමී සරච්චන්ද්‍ර මහත්මියද එක්ව සිටියා ය.

♦ ***අමර ගුණසේකර*** - **France**

# ඉබ්බාගේ කතාව 2



පසුගිය වසරේ අපි ලංකාවට ගියාම අපේ අල්ලපු ගෙදර ඉන්න අය අපිව බලන්න ඇවිත් කතාකරන ගමන් ඉබ්බෙක් ගැන කතාවකුත් කිව්වා. අන්තිමට සඳහන් කළා ඒ ඉබ්බා නිතර මේ පැත්තෙ සැරිසරනවා අපේ වත්තටත් ඇවිත් යන්න පුළුවන්, බලාගෙන ඉන්න කියලා.

ඒක කියලා දවස් කීපයකට පස්සෙ මම දවාලෙ දොරකඩට ආපු වෙලාවෙ එක පාරටම දැක්කා හෙමින් හෙමින් ඉබ්බෙක් ඇවිත් තාප්පයේ යටින් තිබුණු හිදැස් තැනකට රිංගනවා. මට ටක් ගාලා හිතුණා ඒ අර කියපු ඉබ්බා වෙන්න ඇති කියලා.

අල්ලපු ගෙදර අය එදා ඉබ්බා ගැන කියපු කතාවෙ ඉතුරු හොඳ කොටස මට මුලින් කියන්න අමතක වුණා. ඒ කොටස මේකයි. මේ ඉබ්බා කොහෙන් ආපු එකෙක්ද දන්නෙ නැතිලු. ඒ පැත්තෙ වෙන ගෙදරක ඉන්න අයට වැස්සක් දවසෙ පාරෙ යන කොට මගදි හම්බවෙලා. ඒ මිනිස්සුන්ට හිතිලා ඉබ්බව ගෙදර ගෙනැල්ලා හුරතලේට හදාගන්න ඕන කියලා. ගෙදර ගෙනාවමලු ඒ අය හිතුවෙ ඉබ්බට ඉතින් කන්න දෙන්නෙ මොනවද කියලා. අහලා තිබුණලු ඉබ්බා සලාද කොළ, පළා වර්ග කනවයි කියලා. ඉතින් ඒ අය මාර්කට් ගිහිල්ලා ඉබ්බට හොඳ හොඳ කොළ වර්ග ගෙනැත් කතා කර කර හුරතල් කරකර කවනවලු.

දවසක් අල්ලපු ගෙදර අය දැක්කලු තාප්පෙන් හෙමිහිට ඒ ගොල්ලන්ගෙ වත්ත ඇතුළට කඩදාසියක ඔතපු පාර්සලයක් කවුද වීසිකරනවා. බැලින්නම් අනේ ඉබ්බා මේ වත්තට දාලා.

අල්ලපු ගෙදර අය රණ්ඩු වෙන්න ගියේ නෑ ඒ අයත් ඉබ්බට කන්කුන්, සලාද කොළ වගේ ඒවා ගෙනැල්ල ඉබ්බට කවලා. ඒත් ඒක හැමදාම කරන්නත් බැනේ, එළවළු හරි ගණන්. ඒ හන්දා ඒ අය කළේ ඉබ්බව අරං ගිහිං ළඟම තියන වෙලට දාලා ඇවිල්ලා. මොකද වෙලේ කන්න ඕන තරම් කොළ ජාති තියන නිසා.

ඉතින් එදා මම ඉබ්බා එනව දැක්කත් ඊට පස්සෙ ඉබ්බා ආවෙ නෑ. දවසක් එහා වත්තෙ බල්ලො බුරනවා ඇහිලා මම තාප්පෙන් ඉස්සිලා බැලුවා. එතකොටයි දැක්කෙ උන් බුරන්නෙ ඉබ්බට බව. අනේ ඉබ්බ වෙලේ ඉඳලා ඇවිල්ලා. උගේ කටේ කහපාට මලක්. මට හරි හිනා.

මේ අවුරුද්දෙ ලංකාවට ගියාම මම ඉබ්බාව දැක්කෙම නෑ. ඌ එයි කියලා මම නිතර නිතර බැලුවත් ආවෙ නෑ. මොනව වුනාද දන්නෙ නෑ. ඌ මැරුණාද? එහෙම ලේසියෙන් මැරෙන්නෙත් නෑ මොකද ඉබ්බට මනුස්සයෙකු වැඩිය ආයුෂ තියන නිසා. එහෙම නැත්නම් කවුරු හරි ඌව මරාගෙන කාල ද? නැත්නම් ඉබ්බා වෙන කොහේ හරි ගියා ද? කොහේ ගියත් කරදරයක් නැතුව ඉන්නව නම් එච්චරයි. හැම දේම අපි හිතුවෙ නැති වෙලාවක අවසන් වෙනවා.

දැන් කොහොමත් මට මීට පස්සෙ ඉබි කතාත් සිංහළ ඉවුම් පිහුම් ලියලත් වැඩක් නැහැ. ඒවා පළ කරන්න ලංකාවිත්ති පත්තරේ නැහැ. මෙතෙක් කලක් මා ලිවූ ලිපි ලංකාවිත්තියේ පළකළාට එහි කතුතුමාට මගේ හෘදයාංගම ස්තුතිය පළකරනවා. ලංකාවිත්ති පුවත්පත නැතිවීම කියන්න බැරිතරම් කණගාටුවක්. කතුතුමාගේ අනාගතයට අපේ සුබපැතුම් !

♦ ***චිත්‍රා රමණී ගමගේ*** **London NW2**